කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර )-2011

2013 අගෝස්තු /සැප්තැම්බර්

**BCOM E2045 - උසස් මූල්‍ය ගිණුම්කරණ**

ප්‍රශ්න සංඛ්‍යාව : 05 කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

01. සංසන්දනාත්මක ශේෂ පත්‍ර සමඟ 2012 මාර්තු සඳහා සමනල සමාගමෙහි සාරාංශගත මූල්‍ය ප්‍රකාශන පහත පරිදි වේ.

2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

| | රු. 000' |
|---|---|
| විකුණුම් | 27,050 |
| විකුණුම් පිරිවැය | (16,200) |
| දළ ලාභය | 10,850 |
| මෙහෙයුම් වියදම් | (2,550) |
| පොළී වියදම් | (537.5) |
| මෝටර් වාහන විකිණීමෙන් ලාභ | 62.5 |
| පොළී ආදායම | 30 |
| ලාභාංශ ආදායම | 700 |
| බදු පෙර ලාභ | 8555 |
| ආදායම් බදු | (2450) |
| බදු පසු ලාභය | 6,105 |

මාර්තු 31 දිනට ශේෂ පත්‍ර

| | 2012 රු. 000' | | 2011 රු. 000' | |
|---|---|---|---|---|
| වත්කම් | | | | |
| දේපළ පිරියත හා උපකරණ | | 7012.5 | | 5,900 |
| ආයෝජන | | 7,050 | | 5,100 |
| තොග | | 4,925 | | 4,262.5 |
| ලැබිය යුතු වෙළඳ ණය | | 6,625 | | 4,600 |
| මුදල් හා බැංකු | | 120 | | 450 |

| | | | | |
|---|---|---|---|---|
| | | 25,732.5 | | 20,312.5 |
| හිමිකම් | | | | |
| සාමාන්‍ය කොටස් ප්‍රකාශිත ප්‍රාග්ධනය | | 12,500 | | 8,750 |
| ආදායම් සංචිත | | 6,280 | | 2,175 |
| | | 18,780 | | 10,925 |
| වගකීම් | | | | |
| දිගුකාලීන වගකීම් | 4,100 | | 5,425 | |
| ගෙවිය යුතු වෙළඳ ණය | 1,600 | | 1,800 | |
| ගෙවිය යුතු පොළී | 52.5 | | 12.5 | |
| ගෙවිය යුතු ආදායම් බදු | 1,140 | | 2,150 | |
| බැංකු අයිරාව | 60 | 6,952.5 | - | 9,387.5 |
| | | 25,732.5 | | 20,312.5 |

අතිරේක තොරතුරු

1. වර්ෂය තුල රු. 312,500 ක පිරිවැය වූ සහ රු. 187,500 ක ශුද්ධ පොත් අගයක් තිබුණු මෝටර් වාහනයක් විකුණන ලදී.

2. ගෙවූ ලාභාංශ - රු. 2000,000

3. දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් අතිරේක තොරතුරු පහත පරිදි වේ.

| | 2012.03.31 (රු. 000') | 2011.03.31 (රු. 000') |
|---|---|---|
| පිරිවැය | 10,687.5 | 9000 |
| සමුච්චිත ක්ෂය | (3675) | (3100) |
| ශුද්ධ පොත් අගය | 7012.5 | 5,900 |

ඔබ විසින් 2012.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කළ යුතු වේ.

(මුළු ලකුණු 30)

02. 2010 අප්‍රේල් 01 දින සීමිත A සමාගම සීමිත B සමාගමේ කොටස් වලින් 80 % ක් අත්පත් කරගන්නා ලදී. අත්පත්කරගත් දිනයේදී, සීමිත B සමාගමෙහි ස්ථාවර වත්කම් වල සාධාරණ අගය රු. 225,000 ක් වන අතර ඒ වෙනුවෙන් ඔවුන් විසින් කිසිදු නැවත අගය කිරීමක් ගිණුම් පොත් වල වාර්තා ගත කර නැත. 2010/2011 සහ 2011/2012 වර්ෂ සඳහා ක්ෂය සඳහා රු. 62,500 බැගින් අය කළයුතු වේ. අත්පත් කර ගත් දිනයේ රඳවා ගැනීමේ ලාභ රු. 312,500 කි. 2012 මාර්තු 31 දිනට සමාගම් දෙකෙහි ශේෂ පත්‍ර පහත පරිදි වේ. 2012 මාර්තු 31 දිනට ඒකාබද්ධ ශේෂ පත්‍රය පිළියෙල කරන්න.

03. 2012 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා සීමිත P සමාගමෙහි සහ සීමිත Q සමාගමෙහි ආදායම් ප්‍රකාශ පහත පරිදි වේ.

| | සීමිත P (රු) | සීමිත Q (රු) |
|---|---|---|
| ආදායම් | 3970,000 | 2467,500 |
| විකුණුම් පිරිවැය | 2915,000 | 1712,500 |
| දළ ලාභය | 1055,000 | 755,000 |
| ලාභාංශ ආදායම - සීමිත Q | 17,500 | |
| අනෙකුත් ආයෝජන | 2,125 | |
| පරිපාලන වියදම් | 225,000 | 75,000 |
| බෙදාහැරීමේ වියදම් | 75,000 | 25,000 |
| මෙහෙයුම් ලාභය | 774,625 | 655,000 |
| මූල්‍ය වියදම් | 20,000 | 7,500 |
| බදු පෙර ලාභය | 754,625 | 647,500 |
| බදු | 110,000 | 92,500 |
| ශුද්ධ ලාභය | 644,625 | 555,000 |

අතිරේක තොරතුරු

1. 2007 මැයි 15 දින P සමාගම Q සමාගමෙහි සාමාන්‍ය කොටස් වලින් 80 % ක් අත්පත් කරගත් අතර එදිනට රඳවාගත් ලාභ රු. 525,000 ක් විය.

2. හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ උපුටා ගැනීම.

| | සීමිත P (රු) | සීමිත Q (රු) |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ ලාභය | 3935,000 | 1205,000 |
| වර්ෂයේ ලාභය | 644,625 | 555,000 |
| ගෙවූ ලාභාංශ | (23,750) | (21,875) |
| වර්ෂය අවසානයේ ලාභය | 4555,875 | 1738,125 |

3. වර්ෂය තුල P සමාගම පිරිවැය 25 % ක ලාභ ආන්තිකයක් එකතු කිරීමෙන් පසු Q සමාගමට රු. 360,000 ක් පිරිවැය වූ භාණ්ඩ විකුණන ලද අතර එම භාණ්ඩ වලින් රු. 75,000 ක භාණ්ඩ අවසාන තොගය තුළ ඇතුළත් වේ.

4. වර්ෂය තුළ සීමිත Q සමාගම සීමිත P සමාගමට රු. 24,000 ක ඉන්වොයිසි අගයක් (ලාභ ආන්තිකය 20 % ) වූ භාණ්ඩ විකුණූ අතර එම භාණ්ඩවලින් 1/2 ක් තොගය තුළ ඇතුළත් වේ.

5. කීර්තිනාමය රු. 10,000 කින් හානිකරණය කළ යුතු වේ.

2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනය පිළියෙල කරන්න.

| | A සමාගම (රු) | B සමාගම (රු) |
|---|---|---|
| ජංගම නොවන වත්කම් | | |
| දේපළ, පිරියත හා උපකරණ | 437,500 | 400,000 |
| සීමිත S සමාගමෙහි ආයෝජන | 500,000 | - |
| | 937,500 | 400,000 |
| ජංගම වත්කම් | | |
| තොග | 187,500 | 87,500 |
| වෙළඳ ණයගැතියෝ | 85,000 | 67,500 |
| ජංගම ගිණුම - සීමිත A සමාගම | - | 62,500 |
| මුදල් හා මුදල සමාන දෑ | 55,000 | 42,500 |
| මුළු ජංගම වත්කම් | 327,500 | 260,000 |
| මුළු වත්කම් | 1265,000 | 660,000 |
| වත්කම් හා වගකීම් | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 375,000 | 175,000 |
| රඳවාගත් ලාභ | 562,500 | 395,000 |
| | 937,500 | 570,000 |
| ජංගම නොවන වගකීම් | 125,000 | 25,000 |
| ජංගම වගකීම | | |
| වෙළඳ ණයහිමියෝ | 87,500 | 37,500 |
| ජංගම ගිණුම - සීමිත B සමාගම | 50,000 | - |
| අනෙකුත් වගකීම් | 65,000 | 27,500 |
| මුළු ජංගම වගකීම් | 202,500 | 65,000 |
| මුළු වගකීම් | 327,500 | 90,000 |
| මුළු හිමිකම සහ වගකීම් | 1265,000 | 660,000 |

සටහන්

1. සීමිත B සමාගම සීමිත A සමාගමට පිරිවැයට ලාභය 25% ක් එකතු කරමින් භාණ්ඩ විකුණන ලදී. A හි අවසාන තොගය තුළ B ගෙන් ලැබුණු රු. 8,000 ක භාණ්ඩ ඉන්වොයිසි මිලට පැවතුණි.

2. ජංගම ගිණුම් අතර වෙනසට හේතු වනුයේ A විසින් ගෙවනු ලැබුවත් 2011 මාර්තු 30 දිනට B සමාගමට නොලැබුණු මුදල් වේ.

3. A සමාගම B සමාගමෙන් මිලදී ගත් රු. 7500 ක අගය එකිනෙක සමාගම් වල ශේෂ පත්‍රයේ ලැබිය යුතු වෙළඳ සහ ගෙවිය යුතු වෙළඳ තුළ හඳුනාගෙන ඇත.

4. කීර්තිනාමය 10 % කින් හානිකරණය කළ යුතු වේ.

(මුළු ලකුණු 25)

04. අ. සීමිත A සමාගම සාමාන්‍ය කොටස් 500,000 ක් එකක් රු. 80 බැගින් නිකුත් කළ අතර ගෙවීම් පහත පරිදි සිදු කළ යුතු වේ.

| | |
|---|---|
| අයදුමේදී | රු. 40 |
| විභජනයේදී | රු. 20 |
| ඇරයුමේදී | රු. 20 |

2012.08.01 - කොටස් 500,000 ක් සඳහා අයදුම්පත් ලද අතර සම්පූර්ණයෙන්ම කොටස් විභජනය කිරීමට තීරණය කරන ලදී.

2012.08.10 - විභජනය සිදු කරන ලදී.

2012.08.20 - විභජන මුදල් කොටස්හිමියන් සම්පූර්ණයෙන්ම ගෙවන ලදී.

2012.08.30 - ඇරයුම් මුදල් කැඳවන ලද අතර එය 2012.09.15 දින හෝ එයට පෙර ගෙවන ලෙස දන්වන ලදී.

2012.09.15 - කොටස් 25,000 කට හැර ඉතිරිය සඳහා ඇරයුම් මුදල් සම්පූර්ණයෙන්ම ගෙවන ලදී. සාංගමික ව්‍යවස්ථාවලියේ දක්වෙන පරිදි හිඟ ඇරයුම් මුදල් සඳහා 10 % ක පොළියක් අය කිරීමට සමාගම තීරණය කරන ලදී.

2012.09.30 - සමාගම විසින් ඇරයුම් මුදල් හිඟහිටි කොටස් හිමියන්ට ඒවා නැවත නිකුතු කරන බව දන්වන ලදී.

2012.10.15 - සමාගම රු. 22,000 ක් වියදම් දරමින් කොටසක් රු. 80 බැගින් නැවත නිකුත් කරන ලදී. අවසානයේ ඉතිරි මුදල කොටස් හිමියන්ට ගෙවන ලදී.

ඉහත ගනුදෙනු වාර්තා කිරීම සඳහා අවශ්‍ය ලෙජර් ගිණුම් පෙන්වන්න.

(ලකුණු 10)

ආ. 2012.07.01 දින අයදුම්පත් සමඟ සම්පූර්ණයෙන් ගෙවිය යුතු වන රු. 100 බැගින් වූ 10 % ණයකර 70,000 ක් ABC නිකුත් කරන ලදී. ණයකර 80,000 ක් සඳහා අයදුම්පත් ලැබිණි. 2012.07.30 දින ණයකර විභජනය කළ අතර වැඩිපුර ලද මුදල් හරවා යවන ලදී. පහත එකිනෙක ස්වාධීන අවස්ථා යටතේ අවශ්‍ය ලෙජර් ගිණුම් පෙන්වන්න.

i. ණයකරයක නිකුතු මිල රු. 100

ii. ණයකරයක නිකුතු මිල රු. 120

iii. ණයකරයක නිකුතු මිල රු. 80

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

05. සමාගමක් විසුරුවා හැරිය හැකි ආකාර කෙටියෙන් පැහැදිලි කරන්න.

(මුළු ලකුණු 05)